# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2483/12 - 2026 අප්‍රේල් මස 09 වැනි බ්‍රහස්පතින්දා - 2026.04.09**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

**නැගෙනහිර පළාතේ පළාත් සභාව**

ආණ්ඩුකාර සංදේශ අංක : 2026/01 හි සංශෝධනයයි

**1990 අංක 28 දරන පළාත් සභා (සංශෝධන) පනතින් සංශෝධිත**
**1987 අංක 42 දරන පළාත් සභා පනතේ 32(2) වගන්තිය යටතේ නැගෙනහිර පළාත් රාජ්‍ය සේවය පිළිබඳ**
**බලතල පැවරීම සම්බන්ධයෙන් වූ නියමයයි.**

නැගෙනහිර පළාත් ආණ්ඩුකාරවර ජයන්ත ලාල් රත්නසේකර වන මම 1990 අංක 28 දරන පළාත් සභා (සංශෝධන) පනතින් සංශෝධිත 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 32(1) උප වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2025.12.23 දිනැති හා අංක 2468/10 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයෙහි* මා විසින් උක්ත තේමාව යටතේ පළකරන ලද නියෝගයෙහි දෙවන උපලේඛනයෙහි 4(A)(I) වගන්තිය පහත පරිදි 2026.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි මෙම නියෝගය මගින් සංශෝධනය කරමි.

(1) දෙවන උපලේඛනයෙහි 4(A)(I) වගන්තිය “ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය සම්බන්ධයෙන් වන්නේ නම්, විනය පාලනය පිළිබඳ බලතල ප්‍රධාන ලේකම් විසින් ක්‍රියාත්මක කළ යුතුය”යන වාක්‍ය ඛණ්ඩය ඇතුළත් කර සංශෝධනය කරනු ලැබේ.

1. මෙහි ඇමුණුම I හි 01 වන ඡේදය යටතේ කාණ්ඩගත කර ඇත්තාවූ ද, 1989.11.15 දිනැති හා 56/89 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය හා එහි සංශෝධිත 1993.04.23 දිනැති 56/89 (i) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය හා 1995.11.21 දිනැති අංක 56/89 (ii) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව පළාත් රාජ්‍ය සේවයට නිදහස් කරන ලද්දාවූ හෝ ද්විතීයනය කරන ලද්දාවූ, දීප ව්‍යාප්ත සේවාවන්හි නිලධාරීන් ස්ථානගත කිරීම, ස්ථානමාරු හා මූලික විමර්ශන සිදුකිරීම පිළිබඳ (ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය සම්බන්ධයෙන් වන්නේ නම්, විනය පාලනය පිළිබඳ බලතල ප්‍රධාන ලේකම් විසින් ක්‍රියාත්මක කළ යුතුය) බලතල රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති හා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමත ස්ථාන මාරු පටිපාටියට අනුව ක්‍රියාත්මක කළ යුතුය. කෙසේ වුවද, මෙහි ඇමුණුම I හි ඡේද 01 හි (i), (ii), (vi), සහ (vii) යන වගන්ති යටතේ සඳහන් කර ඇති දීප ව්‍යාප්ත සේවාවන්හි නිලධාරීන් ස්ථානගත කිරීම හා ස්ථානමාරු අදාළ අමාත්‍යාංශ ලේකම්ගේ සහ/හෝ නියෝජ්‍ය ප්‍රධාන ලේකම්ගේ උපදෙස් අනුව මාගේ එකඟතාවය යටතේ සිදුකළ යුතුය.

**ආචාර්ය ජයන්ත ලාල් රත්නසේකර,**
නැගෙනහිර පළාත් ආණ්ඩුකාරවර.

2026 අප්‍රේල් මස 07 වැනි දින,
නැගෙනහිර පළාත් ආණ්ඩුකාර ලේකම් කාර්යාලය,
ඕර්ස් හිල්,
ත්‍රිකුණාමලය,

EOG 04 - 0053


1A - PG 7593 — 04 (2026/04) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*